// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2247/32 - 2021 ඔක්තෝබර් මස 01 වැනි සිකුරාදා - 2021.10.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-ඕ. 4/81 (II).

### 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත

24ඇ සහ 24ඈ වගන්ති යටතේ වූ නියමය

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 24ඇ සහ 24ඈ වගන්ති මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පරිසර අමාත්‍ය, මහින්ද අමරවීර වන මම, මෙම නියමය මගින් "ශ්‍රෙගරි වැව පාරිසරික ආරක්ෂක ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන ප්‍රදේශය සම්බන්ධයෙන් ඉහත සඳහන් වගන්ති යටතේ සාදන ලදුව, 2007 මාර්තු මස 05 වැනි දින අංක 1487/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වැනි සහ III වැනි උපලේඛන පහත පරිදි සංශෝධනය කරනු ලැබේ :-

(1) II වැනි උපලේඛනයේ 15 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :

"16. නානු ඔය සිට නුවරඑළිය දක්වා වන කේබල් කාර් ව්‍යාපෘතිය."

(2) III වැනි උපලේඛනයේ 15 වන අයිතමයට ඉක්බිතිව පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :

"16. නානු ඔය සිට නුවරඑළිය දක්වා වන කේබල් කාර් ව්‍යාපෘතියෙහි ඉදිකිරීම්, මෙහෙයවීම් හා නඩත්තු කිරීම් පාරිසරික ආරක්ෂක ප්‍රදේශයට අගතිදායක බලපෑමක් නොවන පරිදි විය යුතු ය."

**මහින්ද අමරවීර,**
පරිසර අමාත්‍ය.

2021 සැප්තැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

10 - 151

1A - PG 5556 - 2520 - (2021/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*